මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය -2013

-------------------------------------------------------------

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආ ස බැ) අතර 2004 ජුනි 16 දින එළඹි අංක 2080 එස් ආර් අයි (එස් එෆ්) දරන ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.06 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය කාර්යක්ෂමව යොදවා ගැනීමට ශ්‍රී ලංකා රජයට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 1969 ක් වූ අතර එයින් රු. මිලියන 1476.75 ක් හෙවත් සියයට 75 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.පහත සඳහන් දෑ ද ඇතුළුව මාර්ග ව්‍යාපෘති සැකසීම් කටයුතු කරගෙන යාමට ව්‍යාපෘතිය ණය ගන්නාට අරමුදල් සැපයිය යුතුය.

i. පාරිසරික සහ සමාජයීය තක්සේරුව හා යළි පදිංචි කිරීමේ සැලසුම්, විස්තරාත්මක සැලැස්ම සහ ලංසු ලියකියවිලි ඇතුළත් ශක්‍යතා අධ්‍යයන පිළියෙල කිරීමට සහාය දීම.

ii. ලංසු ඇගයීම සහ කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා සහාය වීම.

iii. යම් සහන ගිවිසුම් පිළියෙල කිරීම සහ යම් රාජ්‍ය - පුද්ගලික හවුල් ව්‍යාපාර (PPP) උප ව්‍යාපෘති සමඟ සාකච්ඡා හුවමාරු කර ගැනීම.

2014 සැප්තැම්බර් 15 දින ව්‍යාපෘතිය එහි කාර්යයන් ආරම්භ කරන ලද අතර 2012 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ

ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

---------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල්, ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

4.1 මූල්‍ය කාර්යසාධනය

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 52,157,908 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 1,905,547,014 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | 2013 | | 2012 | |
| | රු. | | රු. | රු. |
| **උපකරණ :** | | | | |
| පැකේජය - II | (1,451,117) | * | (1,680,028) | 2,251,781 |
| **කෙරීගෙන යන වැඩ :** | | | | |
| ( ව්‍යාපෘති වියදම්) | | | | |
| පැකේජය - II | 4,085,187 | | 4,372,793 | 119,425,923 |
| නැගෙනහිර සහ උතුරුමැද පළාත් | (35,909) | ** | (132,547) | 6,648,420 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | - | | - | (4,591,646) |

| | | | |
|---|---|---|---|
| **උපදේශක සේවා :** | | | |
| පැකේජය - I | - | - | 399,531,991 |
| පැකේජය - II | - | - | 410,811,723 |
| පැකේජය - I | - | 258,100 | 169,454,270 |
| පැකේජය - V | 143,323 | 3,020,654 | 236,668,633 |
| අතිරේක මූල්‍යයනය සඳහා පැකේජ මාර්ග | 10,222,426 | 185,113,251 | 195,335,677 |
| පුද්ගල උපදේශකවරුන් 'A' | - | - | 4,045,039 |
| පුද්ගල උපදේශකවරුන් 'B' | 312,667 | - | 312,667 |
| ජලගැලීම් හානි තක්සේරුව | - | - | 5,106,022 |
| **උපදේශක සේවා :-** | | | |
| කටහිරා සහ ඉන්ජිනි යර්ස් ඉන්ටර්නැෂනල් | 38,881,331 | - | 38,881,331 |
| උපදේශක සේවා - යාපනය | - | 4,533,449 | 91,768,957 |
| උපදේශක සේවා - කි.මී. 400 | - | 53,880,514 | 177,097,420 |
| ප්‍රසම්පාදන උපදේශක සේවා | - | - | 14,947,328 |
| ප්‍රාරම්භක වැඩ - උතුරු මාර්ගය සම්බන්ධිත ව්‍යාපෘතිය | - | - | 902,065 |
| ප්‍රාරම්භක වැඩ - ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය | - | - | 854,701 |
| පොලී ගාස්තු | - | 6,672,823 | 36,094,712 |
| | 52,157,908 | 256,039,009 | 1,905,547,014 |

* ස්ථාවර වත්කම් ක්ෂය කිරීම හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට හා මාර්ග සංවර්ධන අධිකාරියට වත්කම් මාරුකිරීම හේතුකොටගෙන.

** ගලපන ලද ප්‍රත්‍යාගණන අග්‍රිමය හේතුකොටගෙන.

4.2 අග්‍රිම අරමුදල් ගිණුම

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

| | අග්‍රිම ගිණුම් අංකය : 5930 | |
|---|---|---|
| | එ.ජ.ඩො | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 9,996 | 1,271,147 |
| **එකතු කළා :** | | |
| ඌන පූරණයන් | නැත | නැත |
| විදේශ විනිමය වාසිය | - | 35,909 |
| **අඩු කළා :** | 9,996 | 1,307,056 |
| ආපසු ගැනීම් | නැත | නැත |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,996 | 1,307,056 |
| | ===== | ======= |

**5. විගණන නිරීක්ෂණ**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දක්ෂිණ අධිවේගී මාර්ගය කොළඹ දෙසට දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ (SHETC) උපදේශක විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කොන්දේසි 26.1 (ඇ) ප්‍රකාරව නිශ්චිත කාල සීමාව ඇතුළතදී නිමැවුම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 8.3.9 ඡේදයට පටහැනිව රු. 96,589 ක මුදලක් පොදු කාර්ය පිරිවැය ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

(iii) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ඇතුළත ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වීම තහවුරු කරගැනීම පිණිස මාසික, ත්‍රෛමාසික සහ වාර්ෂික ආදි වශයෙන්, අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් සම්පූර්ණ ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි පරිපූර්ණ සමස්ත සැලැස්මක් තිබිය යුතුය. කෙසේ වෙතත්, එවැනි සැලැස්මක් මුළු ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළම ව්‍යාපෘති කාර්යාලය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ඉටුකල යුතු ඉලක්ක සමඟ ප්‍රධාන නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන්වලට අදාළ අයවැය ප්‍රතිපාදන, පැහැදිලිව හඳුනාගෙන

නොතිබුණි. එබැවින්, සමස්තයක් වශයෙන් ගත්කල නියම කළ අරමුණු ඉටුකරගත හැකිවන පරිදි නිවැරදි කිරීම් පියවර ගැනීමට සහ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ව්‍යාපෘතියේ ප්‍රගතිය විධිමත්ව ඇගයීම් කළ නොහැකි විය. සමහර කාර්යයන්ගේ ප්‍රගතිය සහ වැදගත් කරුණු සමාලෝචන රැස්වීම්වලදී හා ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලැබුවද ව්‍යාපෘතියේ කාර්ය සාධනය විධිමත්ව නියාමනය කර නොතිබුණි.

## 6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළදී සහ 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | | 2013 වර්ෂය තුළ උපයෝජිත අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජිත අරමුදල් | | වර්ෂය සඳහා උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන | රු. මිලියන | | % |
| ආ ස බැ | 15 | 1476.75 | 38.72 | | 38.72 | 1517.52 | | 100 |
| ශ්‍රී ලං ර | 05 | 492.25 | 30.00 | | 23.00 | 383.49 | | 77 |
| | 20 | 1969.00 | 68.72 | * | 61.72 | 1901.01 | ** | |

* රු. 35,909 ක් වූ පෙර ගෙවුම් ඇතුළත් වීම හා රු. 9,525,787 ක් වූ ජංගම වගකීම් ඉවත්වීම හේතුවෙන් මෙම මුදල මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

** රු. 1,509,557 ක් වූ පෙර ගෙවුම් ඇතුළත් වීම, රු. 4,860,162 ක් වූ ජංගම වගකීම් ඉවත් වීම හා රු. 1,177,592 ක් වූ ප්‍රදාන ඇතුළත් වීම හේතුවෙන් මෙම මුදල මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

6.2 මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය

-----------------------------------------

නවීන සහ කාර්යක්ෂම මාර්ග ජාලයක අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, ප්‍රාදේශීය මාර්ග නියෝජිතායතනවල සහභාගීත්වය ඇතිව පුනරුත්ථාපනය හා වැඩි දියුණු කළයුතු මාර්ග හඳුනාගෙන තිබුණි. මුළු දිග

කි.මි. 2200 ක් වූ ජාතික මහාමාර්ග හා දිග කි.මී. 2900 ක් වූ පළාත් මාර්ග ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට හා විස්තරාත්මක සැලැස්මක් පිළියෙල කිරීම සඳහා තෝරාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ජාතික මහා මාර්ග කි.මී. 3141 ක් සඳහා සහ පළාත් මාර්ග කි.මි.3,119 ක් සඳහා රු. මිලියන 1,753.43 කට උපදේශක සේවා කොන්ත්‍රාත්තුවක් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘති ප්‍රගති වාර්තාවට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට කි.මී. 4,940 ට අදාළ ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලැස්ම ව්‍යාපෘතිය විසින් නිම කර තිබුණි.

කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සහ සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත වියදම පහත පරිදි වේ.

| පැකේජය | ප්‍රදානය කළ කොන්ත්‍රාත් වටිනාකම | කොන්ත්‍රාත්තුවට අනුව මාර්ග දිග ප්‍රමාණය | නිම කරන ලද මාර්ග තථ්‍ය දිග ප්‍රමාණය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | රු. මිලියන | කි.මී. | කි.මී. | රු. |
| පැකේජය I | 475.80 | 1,500 | 27- FS | 268.7 |
| පැකේජය II | 362.17 | 2.400 | 157- DD | 410.8 |
| පැකේජය 1 B | 100 | 351 | 2,400 | 130.8 |
| පැකේජය 1 C | 160 | 664 | 347 | 169.4 |
| පැකේජය V සහ VA | 156.19 | 436 | 664 | 158.3 |
| පැකේජය V B | 70.36 | 77 | 436 | 78.2 |
| | | | 77 | |
| පැකේජය X –NH | 170.20 | 113 | 113 | 185.1 |
| පැකේජය X - පළාත් මාර්ග | | 69 | 69 | |
| යාපනය | 91.27 | 250 | 250 | 91.8 |
| කිලිනොච්චි/ මුලතිවු | 167.44 | 400 | 400 | 177.0 |
| | 1753.43 | 6,260 | 4,940 | 1670.1 |